# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2141/22 – 2019 සැප්තැම්බර් 18 වැනි බදාදා – 2019.09.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2019 අංක 176 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/7/2018/HW/367.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: KDS/TUM/4/1/6/6.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2019 සැප්තැම්බර් මස 11 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී.–** ප්‍රාදේශීය ලේකම්, තුම්පනේ.

2. **ඉඩමේ විස්තරය.–** මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩපළාත බටහිර කෝරළේ සුළු කොට්ඨාසයේ, පුබ්බිලිය (321) ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පුබ්බිලිය (අ.ග.පි. 192 තුළ) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මහ/ටීඑම්පී/2019/111 හා 2019.05.08 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – වැලිගොඩේවත්ත – ප්‍රමාණය: හෙක්. 0.2074 ක් පමණ**

උතුරට: තුම්පනේ ප්‍රාදේශීය සභාව හිමිකම් කියන වැලිගොඩේවත්ත සහ කේ. පී. යූ. ධර්මදාස හිමිකම් කියන වැලිගොඩේවත්ත; නැගෙනහිරට: කේ. පී. යූ. ධර්මදාස හිමිකම් කියන වැලිගොඩේවත්ත සහ ඇළ; දකුණට: ඇළ සහ රජය හිමිකම් කියන වැලිගොඩේවත්ත; බටහිරට: රජය හිමිකම් කියන වැලිගොඩේවත්ත සහ තුම්පනේ ප්‍රාදේශීය සභාව හිමිකම් කියන වැලිගොඩේවත්ත.



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

02. **කැබලි අක්ෂර 'බී' – බෙට්වර්ත් එස්ටේට් (පුද්ගලික කොටස) – ප්‍රමාණය: හෙක්. 0.0281ක් පමණ**

උතුරට: ඊ. ජී. සුමනබණ්ඩා හිමිකම් කියන බෙට්වර්ත් එස්ටේට් සහ රජය හිමිකම් කියන බෙට්වර්ත් එස්ටේට්; නැගෙනහිරට සහ දකුණට: රජය හිමිකම් කියන බෙට්වර්ත් එස්ටේට්; බටහිරට: ඊ. ජී. සුමනබණ්ඩා හිමිකම් කියන බෙට්වර්ත් එස්ටේට්.

03. **කැබලි අක්ෂර 'සී' – බෙට්වර්ත් එස්ටේට් (පුද්ගලික කොටස) – ප්‍රමාණය: හෙක්. 0.0153ක් පමණ**

උතුරට: රජය හිමිකම් කියන බෙට්වර්ත් එස්ටේට්; නැගෙනහිරට: රජය හිමිකම් කියන බෙට්වර්ත් එස්ටේට් සහ ඊ. ජී. සුමනබණ්ඩා හිමිකම් කියන බෙට්වර්ත් එස්ටේට්; දකුණට: ඊ. ජී. සුමනබණ්ඩා හිමිකම් කියන බෙට්වර්ත් එස්ටේට්; බටහිරට: ඊ. ජී. සුමනබණ්ඩා හිමිකම් කියන බෙට්වර්ත් එස්ටේට් සහ රජය හිමිකම් කියන බෙට්වර්ත් එස්ටේට්.

09 – 76

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.